ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2024/2025
අවසාන පරීක්ෂණය - 2025
**STP9619 -** අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය
කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2026.02.07 වේලාව : ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

01. "මාර්ගෝපදේශනය සහ උපදේශනය යනු සිසුන්ගේ සංවර්ධනයට සහ ගැලපීමට සහාය වන අත්‍යවශ්‍ය සංවර්ධන ක්‍රියාවලියකි."

(i.) සුදුසු නිර්වචනයක් යොදා ගනිමින් මාර්ගෝපදේශනය සහ උපදේශනය සංවර්ධනාත්මක ක්‍රියාවලියක් ලෙස සලකන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) උපදේශනය මානව සංවර්ධනයේ ප්‍රධාන ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරයි. එවැනි ක්ෂේත්‍ර තුනක් (03) නම් කර ඒ සෑම ක්ෂේත්‍රයකට ම සුදුසු උදාහරණයක් දෙමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

(iii.) අධ්‍යාපනයේ මාර්ගෝපදේශනය සහ උපදේශනය සිසුන්ගේ සමස්ත සංවර්ධනයට ධනාත්මක ලෙස බලපායි සුදුසු උදාහරණ තුනක් (03) සපයමින් මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 12)

(ලකුණු 25 )

02. "ප්‍රතිකාරාත්මක ප්‍රවේශයන් යනු ඵලදායි උපදේශන භාවිතයට මඟ පෙන්වන අත්‍යවශ්‍ය රාමු වේ. "

(i.) උපදේශනයේ ප්‍රතිකාරාත්මක ප්‍රවේශය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) පහත සඳහන් ප්‍රතිකාරාත්මක ප්‍රවේශයන්ගේ මූලික මූලධර්ම සඳහන් කරන්න.

a. මනෝ විශ්ලේෂණ ප්‍රවේශය
b. පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය
c. චර්යාවාදී ප්‍රවේශය (ලකුණු 09)

(iii.) ඉහත සාකච්ඡා කර ඇති ප්‍රතිකාරාත්මක ප්‍රවේශයන්ගෙන් එකක් තෝරාගෙන, එහි ශිල්පීය ක්‍රම පොදු මානසික ගැටළු කළමනාකරණය කිරීමට සිසුන්ට සහය වීම සඳහා පාසල් උපදේශකවරයෙකුට භාවිත කළ හැකි ආකාරය සුදුසු නිදසුනක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 11)

(ලකුණු 25 )

03. "ද්විතීයික පාසලක මෑතකදී එහි උපදේශන සේවා පුළුල් කර ඇත්තේ සිසුන් අතර අධ්‍යයන ආතතිය, සම වයසේ මිතුරන් අතර ගැටුම් සහ පවුල් ආශ්‍රිත ලැටළු පිළිබඳ වාර්තා වැඩි වීම හේතුවෙනි. අලුතින් පත් කරන ලද පාසල් උපදේශකවරියක් වන ජයනි මහත්මිය, චිත්තවේගීය අර්බුද, රහස්‍යභාවය රැකීම, සහ ගුරු යොමු කිරීම් වැනි සංවේදී අවස්ථා හැසිරවීම සඳහා වගකිව යුතුය. කෙසේ වෙතත්; එම පාසලට එහි උපදේශන වැඩසටහන සඳහා විධිමත් ආචාර ධර්ම පද්ධතියක් (code of Ethics) නොමැත. විවිධ ගුරුවරුන් ජයනි මහත්මිය ශිෂ්‍ය තොරතුරු නිදහසේ බෙදා ගනු ඇතැයි අපේක්ෂා කරයි. දෙමාපියන් ඇයට රහස්‍ය තොරතුරු හෙළි කිරීමට බලපෑම් කරයි, සහ ඇය ඇතැම් සිසුන්ට ප්‍රමුඛත්වය දෙනු ඇතැයි පරිපාලනය අපේක්ෂා කරයි. සීමාවන් සහ වෘත්තීය වගකීම් පිළිබඳව අවිනිශ්චිත බවක් දැනෙන ජයනි මහත්මිය පාසල තුළ විධිමත් උපදේශන ආචාර ධර්ම පද්ධතියක් සම්මත කර ගැනීම සඳහා පෙනී සිටීමට පටන් ගනී."

(i.) ඉහත සිද්ධිය මත පදනම්ව, පාසලේ මාර්ගෝපදේශනය සහ උපදේශන සේවාවන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ලෙස ස්ථාපිත ආචාර ධර්ම පද්ධතියක් අත්‍යවශ්‍ය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) රහස්‍යභාවය, ගුරු අපේක්ෂාවන් සහ දෙමාපියන්ගේ පීඩනය සම්බන්ධ අවස්ථාවන්හි දී ජයනි මහත්මියගේ වෘත්තීයභාවය පවත්වා ගැනීමට ආචාර ධර්ම පිළිපැදීම අවශ්‍ය වන ආකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 09)

(iii.) පාසල එහි උපදේශන සේවා සඳහා පිළිගත් ආචාර ධර්ම පද්ධතියක් නොමැතිව අඛණ්ඩව ක්‍රියාත්මක වන්නේ නම්, ඇතිවිය හැකි ප්‍රධාන ප්‍රතිවිපාක පහත අංශ යටතේ පුරෝකථනය කර ඇගයීමට ලක් කරන්න:

(අ) සිසුන්
(ආ) උපදේශක
(ඇ) පාසල් පද්ධතිය

ඔබගේ පිළිතුර අදාළ ආචාර ධර්ම දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 12)

(ලකුණු 25 )

04. "වෘත්තීය මාර්ගෝපදේශන න්‍යායන් අවබෝධ කර ගැනීම සිසුන්ට ඔවුන්ගේ අනාගතය පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට උපකාර කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි."

(i.) වෘත්තීය උපදේශනයේ ප්‍රධාන න්‍යායන් දෙකක් **(02)** නම් කර ඒවායේ මූලික මූලධර්ම සංසන්දනය කරන්න. (ලකුණු 06)

(ii.) ඉහත සඳහන් කළ න්‍යායන්ගෙන් එකක් තෝරාගෙන ගුරුවරයෙකු ලෙස ඔබේ භූමිකාව තුළ සිසුන්ට සුදුසු සහ යථාර්ථවාදී වෘත්තිය තේරීම් කිරීමට උපකාර කිරීම සඳහා එහි මූලික මූලධර්ම යෙදිය හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 09)

(iii.) සැබෑ පාසල් තත්ත්වයන්ගෙන් උදාහරණ දෙකක් **(02)** උපුටා දක්වමින් ශ්‍රී ලංකාවේ පාසල්වල වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන්හි වත්මන් භාවිතයන් සහ අභියෝග විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(ලකුණු 25 )

05. ශ්‍රී ලංකාවේ වේගවත් සමාජ, ආර්ථික සහ අධ්‍යාපනික වෙනස්කම් අත්විඳිමින් සිටී. මෙම අභියෝග ජය ගැනීමට තරුණ තරුණියන්ට සහාය වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන පාසල්, විශ්වවිද්‍යාල සහ ප්‍රජා මධ්‍යස්ථානවල විවිධ මාර්ගෝපදේශන සහ උපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

අධ්‍යාපනික පර්යේෂකයෙකුට සහ වෘත්තිකයෙකු ලෙස, මෙම වැඩසටහන්වල කාර්යභාරය සහ කාර්යක්ෂමතාව ඇගයීම සහ රට පුරා සිසුන්ට සහ තරුණයින්ට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා වැඩිදියුණු කිරීම් යෝජනා කිරීම ඔබට පැවරී ඇතැයි සිතන්න.

(i.) සමාජ, අධ්‍යාපනික සහ ආර්ථික සන්දර්භය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවෙම් සිසුන් සහ තරුණයින් දැනට මුහුණ දෙන ප්‍රධාන අභියෝග හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ඉහත සඳුනාගත් අභියෝග ජය ගැනීමට සිසුන්ට සහාය වීම සඳහා පාසල් හෝ විශ්වවිද්‍යාල මාර්ගෝපදේශන හා උපදේශන සේවාවන්ට ගත හැකි ප්‍රායෝගික ක්‍රම සාකච්ඡා කරන්න. (ලකුණු 09)

(iii.) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මාර්ගෝපදේශ සහ උපදේශන වැඩසටහනක් පිළිබඳ පහත කරුණු ඔස්සේ විචේචනාත්මකව සාකච්ඡා කරන්න.

(අ) එහි අරමුණු
(ආ) ප්‍රධාන ලක්ෂණ
(ඇ) එය පාසල් සිසුන්, නව යොවුන් වියේ පසුවන්නන් සහ රැකියා විරහිත තරුණයින්ගේ අවශ්‍යතා කෙතරම් ඵලදායී ලෙස සපුරාලන්නේද යන්න

හැකි සෑම විටකම උදාහරණ දෙමින් ඔබේ සාකච්ඡාව තහවුරු කරන්න.

(ලකුණු 12)

(ලකුණු 25 )

06. සුනිල් ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසලක පාසල් උපදේශකවරයෙකි. පසුගිය වසර පුරා, ඉගෙනීම් දුෂ්කරතා, ශාරීරික ආබාධ සහ චිත්තවේගීය/ චර්යාත්මක අභියෝග ඇති සිසුන් සංඛ්‍යාව වැඩි වන බව ඔහුට නිරීක්ෂණය විය. මෙම සිසුන්ට සහාය වන්නේ කෙසේද යන්න පිළිබඳව බොහෝ ගුරුවරුන්ට සහ දෙමාපියන්ට නිශ්චිත අදහසක් නැත. විශේෂ අධ්‍යාපන ඒකකවලට සාපේක්ෂව පාසල් උපදේශකයාගේ කාර්යභාරය පිළිබඳව ද ව්‍යාකූලත්වයක් පවතී.

(i.) 'විශේෂ අධ්‍යාපන අවශ්‍යතා' යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති පාසල් සිසුන් අන්තර්කරණය කිරීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උපදේශන වැඩසටහන්වලට දායක විය හැකි ආකාරය විචේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 09)

(iii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන් සඳහා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පාසල් උපදේශකවරුන් මුහුණ දෙන ප්‍රායෝගික අභියෝග තුනක් **(03)** හඳුනාගෙන මෙම අභියෝග ජය ගැනීම සඳහා ගතහැකි අපාය මාර්ග තුනක් **(03)** යෝජනා කරන්න. (ලකුණු 12)

(ලකුණු 25 )

-හිමිකම් ඇවිරිණි. -